# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2338/36 – 2023 ජුනි මස 28 වැනි බදාදා – 2023.06.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2020/270.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

01. එම්. ජේ. චන්ද්‍රසේන මයා,
අංක 217/25,
සිරිල් ජැන්ස් මාවත,
පානදුර.

02. බී. චන්ද්‍රසේකර මයා,
අංක 35/5,
සමඟි මාවත,
දෙපානම,
පන්නිපිටිය.

සහ

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය,
විත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ - 02.


1A – G 39787 – 14 (2023/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මාලඹේ, තලාහේන, මයූර මාවත, අංක 199/4 හි නීතිඥ එස්. ඒ. නිමල් සරණතිස්ස මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනුෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 ජූනි මස 22 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2020/270.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

01. එම්. ජේ. චන්ද්‍රසේන මයා,
අංක 217/25,
සිරිල් ජැන්ස් මාවත,
පානදුර.

02. බී. චන්ද්‍රසේකර මයා,
අංක 35/5,
සමගි මාවත,
දෙපානම,
පන්නිපිටිය.

සහ

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය,
චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ - 02.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ

"ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවකයින් වන එම්. ජේ. චන්ද්‍රසේන මහතාට සහ බී. චන්ද්‍රසේකර මහතාට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 ක්‍රියාත්මක කිරීමේ දී පහත කරුණු මගින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ".

- තනතුරු නාමය වෙනස් වීම.
- වැටුප් විෂමතාවයක් සිදුව තිබේ නම් එසේ විෂමතාවයක් ඇති වීම.
- උසස්වීම ලබා දීමේ දී ආයතන කටයුතු කර ඇති ආකාරය.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජූනි මස 07 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්
තැනගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 06 – 0222

*මගේ අංකය*: IR/COM/02/2021/188.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2023.01.14 වැනි දින අංක 2314/89 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.01.05 වැනි දින දරන නියෝගයෙන්,

එච්. එච්. ආර්. කේ. හේරත් මිය
නො. 1551/5/17,
අමුඇටමුල්ල පාර,
කොට්ටාව,
පන්නිපිටිය.

සහ

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය,
අංක 170,
හයිලෙවෙල් පාර,
නුගේගොඩ.

අතර පවත්නා 2023.01.02 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල් වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් සී. එන්. විතානාච්චි මහතා වෙත යොමු කරන ලදී.

බේරුම්කරු සී. එන්. විතානාච්චි මහතා බේරුම්කාර ධුරයෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මා එම නියොගය අවලංගු කරන අතර එකී 2023.01.05 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 ජුනි මස 22 වැනි දින,
කොළඹ දී ය.

EOG 06 - 0223/1

මගේ අංකය: IR/COM/04/2021/188.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එච්. එච්. ආර්. කේ. හේරත් මිය
නො. 1551/5/17,
අමුඇටමුල්ල පාර,
කොට්ටාව,
පන්නිපිටිය.

සහ

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය,
අංක 170,
හයිලෙවෙල් පාර,
නුගේගොඩ.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පිළියන්දල, බුද්ධාලෝක පාර, අංක 40, කේ. ඒ. තිලකරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 ජූනි මස 22 වැනි දින,
කොළඹ දී ය.

*මගේ අංකය*: IR/COM/04/2021/188.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එච්. එච්. ආර්. කේ. හේරත් මිය
නො. 1551/5/17,
අමුඇටමුල්ල පාර,
කොට්ටාව,
පන්නිපිටිය.

සහ

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය,
අංක 170,
හයිලෙවල් පාර,
නුගේගොඩ.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,

"ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ සහකාර අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනීමේ දී පවත්වන ලද සම්මුඛ පරීක්ෂණය අනුව ඒ සඳහා ඉදිරිපත් වූ එහි පරිපාලන නිලධාරිනී එච්. එච්. ආර්. කේ. හේරත් මහත්මියට යම් අසාධාරණයක් සිදුව තිබේ ද එසේ අසාධාරණයක් සිදු වූයේ නම් ඒ මහත්මියට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳ වේ".

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජූනි මස 13 වැනි දින,
කොළඹ,
කම්කරු කොමසාරිස් ජනරාල්, තැනගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 06 – 0223/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.